පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව-සති පාසල

විෂය -නාට්‍ය හා රංග කලාව

දෙවන වාරය-ජුනි මාසය- සතිය-3

ශ්‍රේණිය -9

සැකසුම - චතුරිකා ප්‍රියදර්ශනී
ර/නිවි/කහවත්ත මධ්‍ය මහා

# සති පාසල 7

## හඬ අභ්‍යාස පුහුණු වෙමු.

කටහඬ, රංග කාර්යයේ දී අතිශයින්ම වැදගත් වේ. නළුවාට **ප්‍ර**බල කටහඬක් අවශ්‍ය වන විට සකස්කඩය යොදාගනු ලබන්නේ නාට්‍ය හා රංග කලාව විෂයේ වාචික අභිනය නිවැරදි ව භාවිත කිරීමට අවශ්‍ය අභ්‍යාසයක් ලෙසින් ය. සකස්කඩය කියවීමෙන් වචනවල ඇති **මහප්‍රාණ** අක්ෂර, ඌෂ්මාක්ෂර, නාසික්‍ය අක්ෂර හුරු වේ. මෙම අභ්‍යාස නිතර කිරීමෙන් නළුවාට පහත වාසි ලැබේ.

- නිවැරදි භාෂා උච්ඡාරණයට හුරු වේ.
- කටහඬ මනා ලෙස පවත්වාගෙන යාමට හැකි වේ.
- නාට්‍ය විෂයේ දී පළ කියවීමේ දී හා රංගනයේ දී සංවාද භාවිතය හා හඬ පාලනය පහසු වීම.
- ශබ්ද නඟා පොත්පත් කියවීමට හැකියාව ලැබේ.
- **ප්‍රබල** කටහඬක් ලැබේ.
- නිවැරදි භාෂා උච්චාරණය නිසා රංග කාර්යයේ යෙදෙන නළු නිළියන්ට සිය නළු කාර්යය සාර්ථක ව කර ගත හැකි වීම.

උදා:- ගීත ගායනය, සභාවක් ඇමතීම, ක්ෂණික කතාවක් කිරීම, ක්ෂණික නිරූපණ  ඉදිරිපත් කිරීම.

<u>වැඩිදුර අධ්‍යනය සඳහා</u>
https://youtu.be/koq2z207YUA

## <u>පැවරුම</u>

1. **ඔබගේ සිංහල පෙළපතේ වැතිර ජාතක කතාවක් පාදක කරගනිමි ගනිමින් කෙටි නාට්‍ය පිටපතක් රචනා කරන්න.**
2. **බුද්ධධර්මය පෙළ පොතෙන් ඔබ කැමති ගාථා දෙකක් තෝරා ලියන්න.**
3. **සිරිත් මල්දමෙහි එන කවි හතරක් ලියන්න.**
4. **අක්ෂරයන් 3ක්, 4ක්, 5ක්,6ක්, ඇත්තෙ නගර හා ගම්වල නම් 5 බැගින් වෙන වෙනම ලියා එම නම් ඔබ කැමති රිද්මයකට අනුව කියවන්න.**
5. **ඔබ තෝරාගත් ගත් ගාථාවන් පාඩම් කර ශබ්ද නගා ගායනා කරන්න.**
6. **ඔබ ලියූ සිරිත් මල්දමෙහි කවි පාඩම් කර තාලයකට ගායනා කරන්න.**